# TRICO INTERNATIONAL PTY LTD, HALLAM VICTORIA වෙතින්



## ඕස්ට්‍රේලියාවේ වෙසෙන

## සියළු ශ්‍රී ලාංකිකයනට පිදෙන



# අවුරුදු තිළිණයකි

## වර්ෂ 2015 සිංහල අලුත් අවුරුදු නැකැත් චාරිත්‍ර (Melbourne)

### පුණ්‍ය කාලය

2015 අප්‍රේල් මස 14 වන අඟහරුවාදා උදේ 10.06 සිට 14 වන අඟහරුවාදා රාත්‍රි 11.24 දක්වා කාලය පුණ්‍ය කාලයයි. එදින උදේ 10.06 ට ප්‍රථම ආහාර පාන ගෙන සියලු වැඩ අත්හැර ආගමික වතාවත්වල යෙදීම ද, පුණ්‍ය කාලයේ අපර කොටස තුළ එනම් සවස 2.55 සිට රාත්‍රි 11.24 දක්වා කාලය පහත දැක්වෙන අයුරින් ආහාර අනුභවය, ගනුදෙනු කිරීම හා වැඩ ඇල්ලීම ආදී නැකැත් චාරිත්‍ර විධි ඉටු කිරීම මැනවි.

### අලුත් අවුරුදු උදාව

2015 අප්‍රේල් මස 14 වන අඟුහරුවාදා සවස 2.55 ට සිංහල අලුත් අවුරුද්ද උදා වෙයි.

### ආහාර පිසීම

2015 අප්‍රේල් මස 14 වන අඟහරුවාදා සවස 3.16 ට රතු පැහැති වස්ත්‍රාභරණයෙන් සැරසී නැගෙනහිර බලා ලිප් බැඳ, ගිණි මොළවා දී කිරි හා උක් හකුරු මිශ්‍ර රතු කැකුළු කිරිබත් සහ විළඳ මිශ්‍ර කැවිලි ආහාරය පිළියෙළ කිරීම ඉතා ශුභයි.

**(අඟහරුවාදා දිනය හා කුජ ග්‍රහයාගේ දිනය නිසා රතු කැකුළු හාල් කිරිබත් විශේෂයි.)**

### වැඩ ඇල්ලීම, ගනුදෙනු කිරීම හා ආහාර අනුභවය

2015 අප්‍රේල් මස 14 වන අඟහරුවාදා සවස 3.42 ට රතු පැහැති වස්ත්‍රයෙන් සැරසී නැගෙනහිර බලා ආහාර අනුභව කොට, බුලත් දී ගනුදෙනු කිරීම ඉතා ශුභයි.

### හිස තෙල් ගෑම

2015 අප්‍රේල් මස 15 වන බදාදා උදේ 8.21 ට දකුණු දිසාව බලා හිසට කොහොඹ පත් ද, පයට සැවැන්දරා පත්‍ර ද තබා ලා කොළ පැහැති වස්ත්‍රයෙන් සැරසී තල තෙල් හා කොහොඹ පත් යුෂ මිශ්‍ර නානු ගා ස්නානය කිරීම ඉතා ශුභයි.

### රැකියා සඳහා පිටත්ව යෑම

2015 අප්‍රේල් මස 16 වන බ්‍රහස්පතින්දා උදේ 6.41 ට ලා කොළ මිශ්‍ර ඇඳුමින් සැරසී හකුරු හා තල මිශ්‍ර කිරිබත් අනුභව කොට නැගෙනහිර බලා පිටත්ව යෑම ශුභයි.

(අනෙකුත් ප්‍රාන්තවල අවුරුදු නැකැත් අප්‍රේල් මස කලාපවල බලාපොරොත්තු වන්න.)


ආයුර්වේද වෛද්‍ය හා ජ්‍යොතිෂ්‍ය විශාරද

**වෛද්‍ය ස්ටැන්ලි ධර්මකුමාර**

B.A.M.S., MACF (Sri Lanka)
A.A.A.; F.A.A, AT.MS (Australia)
සිද්ධාර්ථ ආයුර්වේද හා ජ්‍යොතිෂ්‍ය කාර්යාලය
නෝබල්පාක්
www.ayurvedamedicalcentre.com.au
www.astrologycentre.com.au



**Trico International**

Worldwide Freight Forwarding. Imports & Exports. Clearing Agents & Customs Brokers

12 Rimfire Drive, Hallam, Victoria 3803

(03) 9796 3750 - (03) 9796 3775 FREECALL HOTLINE 1800 -1- TRICO 87426

melbourne@tricointernational.com.au www.tricointernational.com.au

Brisbane - 0431 085 421 Ashan Adelaide - 0469 977 830 Manju